**මධ්‍යම පළාත් සභාව - 2020 වර්ෂය**

-----------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මධ්‍යම පළාත් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2021 දෙසැම්බර් 22 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 සැප්තැම්බර් 30 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා වන පදනම ඡේදයෙහි දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මධ්‍යම පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මධ්‍යම පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශන මුදල් පදනම මත පිළියෙල කර ඇති බව ගිණුම්කරණ ප්‍රතිපත්තිවල දක්වා තිබුණද, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ අන්තර් පළාත් ණය ශේෂ නිරවුල් කිරීමේ ගිණුමේ ලැබිය යුතු ශේෂය රු.5,505,247 ක් සහ ගෙවිය යුතු තැන්පතු හා අනෙකුත් වගකීම්, විවිධ වගකීම් හා අන්තර් පළාත් ණය ශේෂ නිරවුල් කිරීමේ ගිණුමේ ගෙවිය යුතු | පළාත් සභාවට අයවිය යුතු රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ලෙස ලබා දුන් ණය ජංගම වත්කම් ලෙස සඳහන් කර ඇත. අදාළ මුදල් වර්ෂය තුළ, මෙම ශේෂය මුදලින් අයකර ගැනීමට ඒ ඒ ආයතන වෙත දැනුම් දී ඇති අතර, එම අයවිය යුතු මුදල් වටිනාකම රු.5,505,247 ක හර ශේෂ ජංගම වත්කම් ලෙස | මූල්‍ය ප්‍රකාශනවල පදනම නිශ්චිතව අනාවරණය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ශේෂය රු.627,859,583 ක් උපචිත පදනමට ගිණුම් ගතකර තිබුණි. | හඳුනාගෙන ඇත. ජංගම වගකීම් වන රු.627,859,583 ක පොදු තැන්පත් ගිණුම් ශේෂය, ක්ෂය සංචිත අරමුදල, වැන්දඹු අනත්දරු සහ විශ්‍රාම වැටුප් දායක අරමුදල් ගිණුම් ශේෂ, මාපනාවතුර සම්පත් මධ්‍යස්ථාන අත්තිකාරම් ගිණුම, අන්තර් පළාත් ස්ථානමාරු ණය ශේෂ ගිණුම්වලින් සමන්විත වන අතර මෙම ගිණුම් ශේෂයන් මධ්‍යම පළාත් සභාව විසින් බාහිර පාර්ශවයන්ට නිරවුල් කළ යුතු ශේෂ වන බැවින් ජංගම වගකීම් ලෙස පෙන්නුම් කර ඇති බව සඳහන් කරමි. | |
| (ආ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ තැන්පත් හා අනෙකුත් වගකීම් යටතේ ක්ෂය සංචිත අරමුදල් ලෙස රු.3,539,788 ක් දක්වා තිබුණ ද,එය කුමන වත්කමක් සඳහා වෙන්කරන ලද්දක් ද යන්න මූල්‍ය ප්‍රකාශන සටහන් මඟින් අනාවරණය කර නොතිබුණි. | ගල්පාලම ගොවිපළ අත්තිකාරම් ගිණුමේ ස්ථාවර වත්කම් ක්ෂය වීමට අදාළ වටිනාකම ක්ෂය සංචිත අරමුදල මඟින් පෙන්නුම් කරයි. පළාත් මූල්‍ය රීති 377 ට අනුව පළාත් භාණ්ඩාගාරයට යොමු කළ එම මුදල පළාත් භාණ්ඩාගාරය විසින් නිසි පරිදි ගිණුම්වල ඇතුළත් කර ඇති බව දන්වා සිටිමි. | අදාළ සියලු තොරතුරු මූල්‍ය ප්‍රකාශන සටහන් වලින් අනාවරණය කළ යුතු වේ. |
| (ඇ) | මධ්‍යම පළාත් ආදායම් ගිණුමට සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ පිටපත් කිරීමේ දී හිඟ ආදායම්ශේෂ 03 ක් රු.33,476,864 කින් වැඩිපුර දැක්වීම හේතුවෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හිඟ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් පෙන්නුම්කර තිබුණි. | ඉදිරිපත් කර තිබූ 2020 වර්ෂයට අදාළ හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශනයේ සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ පිටපත් කිරීමේ දී අතපසුවීමකින් වර්ෂ අවසාන ශේෂ පිටපත් කිරීම නිසා එකතුව රු.33,476,864 ක් වැඩියෙන් පෙන්වා ඇති බව පිළිගනිමි. | 2021 වර්ෂයේ ආදායම් ගිණුම සකස් කිරීමේ දී ආරම්භක හිඟ ආදායම් ශේෂ නිවැරදිව දැක්විය යුතුය. |
| (ඈ) | 2015 වර්ෂයේ සිට එකතුව රු.26,000,000 ක් වැය කර ඉදිකරතිබුණු මධ්‍යම පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටි ගොඩනැගිල්ල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා නොතිබුණි. | බිල්පත් ගෙවීම් අමාත්‍යාංශයෙන් සිදු වූ බැවින් වටිනාකම් ගිණුම් ගත කිරීමට නොහැකි වි ඇත. | මෙම ගොඩනැගිල්ල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | මධ්‍යම පළාත් ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ සමාලෝචිත වර්ෂය අවසානයට පොදු ගිණුම යටතේ දක්වා තිබූණු හඳුනා නොගත් අවිනිශ්චිත ශේෂය රු.832,955 ක් විය. | අන්තර් පළාත් පොදු ගිණුම තුළ රු.1,129,703 ක ශේෂයක් පැවති අතර 2021 වර්ෂයේ මෙම ණය ශේෂයන් රු.296,748 ක් නිරවුල් කළ පසු පොදු ගිණුමේ ශේෂය රු.832,955 කි. මෙම ශේෂයද ඉදිරියේ දී හැකි ඉක්මනින් නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. | ගෙවිය යුතු ස්ථානමාරු ණය ශේෂය හා අවිනිශ්චිත ශේෂය හඳුනාගෙන නිරවුල් කළ යුතුය. |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.
- අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය සැලකිල්ලට ගන්නා නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම,

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.5.1 ශීර්ෂය 541 - සභා ලේකම් කාර්යාලය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගෙ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1997 පෙබරවාරි 03 දිනැති අංක 11/950/ඊ/1151/4 දරන රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය - 02 ඡේදය අනුව තනතුරක වැඩබලන කාලය මාස 03 ක උපරිමයකට යටත්විය යුතු වුවද සභා ලේකම් කාර්යාලයේ සහකාර ලේකම් තනතුරේ වැඩ බැලීමට පත්කර තිබුණු නිලධාරියා 2014 මාර්තු 14 දින සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 06 ක් ඉක්මවා වැඩබැලීම සිදුකර තිබියදීත් ස්ථිර නිලධාරියෙකු පත්කර නොතිබුණි. | හිටපු සහකාර ලේකම්වරයා 2014 වර්ෂය ආරම්භයේදී විශ්‍රාම යාමෙන් අනතුරුව එම තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා සුදුසු අයෙකු බඳවා ගැනීම සඳහා ගැසට් පත්‍රයේ දැන්වීමක් පළ කර සම්මුඛ පරීක්ෂණයක් පවත්වා සභා ලේකම් කාර්යාලයීය කාර්ය මණ්ඩල ප්‍රඥප්තියේ විධිවිධාන ප්‍රකාරව කාර්ය මණ්ඩල උපදේශක කාරක සභාවට යොමු කිරීමෙන් පසු 2014 මාර්තු 14 දින පවත්වන ලද කාර්ය මණ්ඩල උපදේශක කාරක සභාවේ නිර්දේශය මත වැඩ බලන සහකාර ලේකම්වරයකු පත්කර ඇත. ඉදිරියේදී පළාත් සභාව | සහකාර ලේකම් තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| | පිහිටුවීමෙන් අනතුරුව කාර්ය මණ්ඩල උපදේශක කාරක සභාවේ නිර්දේශය මත මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරමි. | |

### 1.5.2 ශීර්ෂය 542 - ප්‍රධාන ලේකම් කාර්යාලය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 ජනවාරි 22 දිනැති මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක CPC/CS/8/1/1 දරන මූල්‍ය ප්‍රකාශන 2019 චක්‍රලේඛයේ 3.4 ඡේදයට පටහැනිව 542-3-4-2602 විශේෂ අවශ්‍යතා සහිත ගම්මාන සංවර්ධනය කිරීමේ වැය විෂය සඳහා ඉකුත් වර්ෂයේ එළඹී තිබුණු බැරකම් ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශන අනුව රු.95,947,016 ක් වුවද එය අභිබවා රු.96,609,609 ක බැරකම් නිරවුල් කර තිබුණි. | මෙවැනි අතපසු වීම් ඉදිරියට නොවීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | මූල්‍ය ප්‍රකාශන මඟින් සියලු බැරකම් අනාවරණය කළ යුතුය. |

### 1.5.3 ශීර්ෂය 545 - පළාත් මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වර්ෂය තුළ රු.2,140,860,112 ක මුද්දර ගාස්තු හා රු.130,555,222 ක උසාවි දඩ ආදායමක් පළාත් සභාව විසින් රැස්කර තිබුණද ඉන් පළාත් පාලන ආයතන වෙත ගෙවා තිබුණේ රැස්කළ ආදායමෙන් සියයට 0.06 ක් වූ රු.1,310,102 ක මුද්දර ගාස්තු පමණි. එමෙන්ම උසාවි දඩ ආදායම් පළාත් පාලන ආයතන වෙත ගෙවා නොතිබුණි. | මුද්දර ගාස්තු රැස්කළ ආදායමින් සමාලෝචිත වර්ෂයේ දී සියයට 52 ක් ගෙවා ඇත. | පළාත් පාලන ආයතනවලට අදාළව ලැබී තිබුණ, මුද්දර ගාස්තු හා උසාවි දඩ ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) මධ්‍යම පළාත් මූල්‍ය රීති 116.1 ප්‍රකාරව හිඟ ආදායම් අයකර ගැනීමේ දී එකතු කරන නිලධාරීන් ඒ පිළිබඳ අවධානයෙන් හා ඉතාම සැලකිලිමත්ව සිටිය යුතු බවට හා අවශ්‍ය අවස්ථාවලදී නියමිත කාලය | හිඟ ආදායම් එකතු කිරීම සඳහා විශේෂ විධිවිධාන යෙදවීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තුළ නීති මඟින් කටයුතු කිරීම සඳහා විධිවිධානයන් යෙදීම ගැනද වගකිව යුතු වුවද සමාලෝචිත වර්ෂයේ දී 2017,2018 සහ 2019 වර්ෂවලට අදාළව මධ්‍යම පළාතේ ආදායම් ගිණුමෙන් රු.6,773,747ක හිඟ ආදායම් කපාහැර තිබුණි. එමෙන්ම එම ආදායම් ගිණුම අනුව ආදායම් විෂයය 06 කට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.195,023,111 ක හිඟ ආදායම්අයවිය යුතුව පැවතුණි. | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් මධ්‍යම පළාත් සභාවට ලැබිය යුතු කාල විශ්ලේෂණයක් ඉදිරිපත් නොකළ රු.171,988,242 ක අත්තිකාරම් මුදල් අයකරගෙන නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.4 මධ්‍යම පළාත් කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය**

-----------------------------------------------------------

| | | | |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු,277,266,040 ක ආදායම්, රු.249,955,841 ක වියදම් සහ රු.310,604,044 ක වත්කම් සහ වගකීම් විෂයයන්ට අදාළව ලෙජර් ගිණුම් පිළියෙල කර නොතිබුණි. | ප්‍රධාන කළමනාකරණ නිලධාරිනිය 2019 වර්ෂයේ මැද භාගයේ දී විශ්‍රාම ගොස් ඇති අතර ඒ වෙනුවට මේ දක්වා ප්‍රධාන කළමනාකරණ නිලධාරියෙකු අනුයුක්ත කර නොමැත. මේ වන විට අදාළ විෂය වෙනත් නිලධාරිනියක් මඟින් ඉටුකරවා ගන්නා අතර 2021 වර්ෂයේදී පොදු ලෙජරය නිවැරදිව නඩත්තු කර පවත්වාගෙන යන බව කාරුණිකව සඳහන් කරමි. | ආයතනයේ වත්කම් සහ වගකීම් ආදායම් හා වියදම්වලට අදාළ පොදු ලෙජරයක් නඩත්තු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.55,000,000 ක ස්ථාවර තැන්පතු ආයෝජන සඳහා මධ්‍යම පළාත් මූල්‍ය රීති 310.2 ප්‍රකාර ලේඛනයක් පවත්වා නොතිබුණි. | මූල්‍ය රීති වලට අනුකූලව ස්ථාවර තැන්පතු ආයෝජන සඳහා ලේඛනයක් පවත්වාගෙන නඩත්තු කිරිමට විගණනයේ උපදෙස් පරිදි කටයුතුකර ඇත. | ස්ථාවර තැන්පතු ආයෝජන ලේඛනය යාවත්කාලීනව පවත්වාගත යුතුය. |

**1.5.5 ශීර්ෂය 550 - ප්‍රධාන අමාත්‍යාංශය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2015 අංක 03 දරන මධ්‍යම පළාතේ පළාත් සභාවේ මුල් ළමාවිය සංවර්ධන ප්‍රඥප්තියේ III වන කොටසේ 32(3) වගන්තිය අනුව මධ්‍යම පළාත් මුල් ළමාවිය සංවර්ධන ඒකකය සඳහා එක් එක් මුදල් වර්ෂය වෙනුවෙන් වර්ෂයේ ආදායම් හා වියදම් සහ වෙනත් සියලු ගනුදෙනු ඇතුළත් වාර්ෂික ගිණුම් ප්‍රකාශනයක් පිළියෙල කළයුතු අතර ප්‍රඥප්තියේ 34 වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා විසින් එම ගිණුම් ප්‍රකාශනය විගණනය කළයුතු වේ. එහෙත් 2016 වර්ෂයේ සිට වර්ෂ 05 ක් ගත වුවද මෙම ඒකකය වෙනම ගිණුම් ප්‍රකාශනයක් පිළියෙල කර පළාත් භාණ්ඩාගාරය වෙත හා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුල් ළමාවිය සංවර්ධන ඒකකය සඳහා කාර්ය මණ්ඩලය විගණනය සිදු කරන අවස්ථාව වන විටත් අනුමත වී නොතිබුණි. දැනට කාර්යමණ්ඩලයක් පත් කර ඇති බැවින් ඉදිරියේදී එම ඒකකයේ කාර්යන් සම්බන්ධයෙන් වෙනම ගිණුමක් පිළියෙල කර පළාත් භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළහැකි බව දන්වමි. | 2016 වර්ෂයේ සිට වාර්ෂික ගිණුම් ප්‍රකාශන පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |

**1.5.6 ශීර්ෂය 551 - පළාත් පාලන දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විගණකාධිපති විසින් මධ්‍යම පළාතේ, පළාත් පාලන ආයතන සඳහා 1996 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අතර කාල පරිච්ඡේදය තුළ නිකුත් කර තිබුණු රු.3,688,891 ක අධිභාර සහතික 10 ක් සම්බන්ධයෙන්, අභියාචනා ලැබී ඇත්නම් ඒ පිළිබඳව ද සලකා බලා මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අධිකරණ කාර්යයන් නිම වීමෙන් පසු හා අභියාචනා අවසන් වීමෙන් පසු අය කිරීමට කටයුතු කරන අතර, පාර්ශව කීපයක් විසින් කොටස් වශයෙන් ද මුදල් ගෙවා ඇත. | අධිභාර අයකර ගත යුතුය. |

**1.5.7 ශීර්ෂය 552 - අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 12.5.4 වගන්තිය අනුව නිලධාරියෙකු ස්ථිර තනතුරක් දරන | පත්කිරීම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 12.3 වගන්තිය යටතේ රාජකාරී ඉටුකිරීම | වැඩිපුර ගෙවා ඇති වැටුප් ආපසු අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අතරතුරදී තවත් තනතුරක වැඩ බලන්නේ නම් පමණක් වැඩ බැලීමේ දීමනාව ලබාගත හැකි වුවද නාඋල සහ ගලේවෙල කලාප අධ්‍යාපන කාර්යාලවලට වැඩ බැලීම සඳහා පත්කර තිබුණු කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්ට එම තනතුරේ රාජකාරී පැවරීම පමණක් කර තිබුණු අතර ඔවුන් වෙනත් තනතුරක කාර්යයන් ද ආවරණය කර නොතිබුණි.එහෙත් 2016 පෙබරවාරි සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් දක්වා රු.857,789 ක් නාඋල කලාපයේ අධ්‍යාපන අධ්‍යක්ෂකට සහ 2016 ජනවාරි සිට සමාලෝචිත වර්ෂයේ අගෝස්තු දක්වා රු.828,130 ක් ගලේවෙල කලාපයේ අධ්‍යාපන අධ්‍යක්ෂකට එකතුව රු.1,685,919 ක වැඩ බැලීමේ වැටුප් ගෙවා තිබුණි. | වශයෙන් සංශෝධනය කරන ලෙස ඉල්ලීමක් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමුකර ඇත. එය සංශෝධනය කළ පසු වැඩ බැලීමේ වැටුප් අයකිරීමට කටයුතු කරනු ලබන බව දන්වමි. | |
| (ආ) | මාතලේ, ගලේවෙල, විල්ගමුව අධ්‍යාපන කලාපවලට අයත් පාසල්වල පුරප්පාඩු වී ඇති විදුහල්පති තනතුරු සඳහා පිළිවෙළින් වසර 32, 47 හා 27 බැඟින් වූ කාලයක් තිස්සේ වැඩබලන විදුහල්පතිවරුන් පත්කර තිබුණු අතර ඇතැම් වැඩ බලන විදුහල්පති වරුන් වසර 13 කට අධික කාලයක සිට එම තනතුරේ රාජකාරි ඉටුකරමින් පැවතුණි. මාතලේ කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු 04 කට වැඩබලන අධ්‍යක්ෂවරුන් පත්කර තිබුණු අතර ඇතැම් නිලධාරින් වසර 18 කට වඩා වැඩබලන කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරේ වැඩ බලමින් පැවතුණි. | ශ්‍රේණිධාරී විදුහල්පතිවරයෙකු පත්කරන තෙක් පාසල පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය සලකා බලා පාසලේ ජොෂ්ඨතම ගුරුභවතා රාජකාරී ඉටුකිරීම සඳහා පත්කර ඇත. | පුරප්පාඩු පවතින විදුහල්පති තනතුරු සඳහා ස්ථිර විදුහල්පතිවරු පත් කිරීම. |

| | | |
|---|---|---|
| (ඇ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, අවස්ථා 193 කට අදාළ වසර 5 සිට 10 දක්වා කාල පරාසයක් තුළ රු.19,375,312 ක, අවස්ථා 45 කට අදාළ වසර 10 ට වැඩි රු.3,495,427 ක වාහන අනතුරුවලින් සිදු වී තිබුණු අලාභ හානි සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රීති 55.2.1 සහ 55.4 ප්‍රකාර මුදල් අයකර ගැනීම හෝ විනයානුකූලව කටයුතු කිරීම හෝ සිදු කර නොතිබුණි. | වගකිව යුතු නිලධාරීන්ගෙන් අධිභාර කිරිම, වැටුපෙන් වාරික වශයෙන් සිදු කිරිම හා විශ්‍රාම වැටුප් පරිතෝෂිකයෙන් අධිභාර අය කිරිම, වගකිය යුතු නිලධාරින් කිහිප දෙනෙකුගෙන් අධිභාර අය කර ගැනීමට ඇති අවස්ථාවන්හිදී සියලුම දෙනාගෙන් අධිභාර අය කිරිමෙන් පසුව කපා හැරිමට ඉදිරිපත් කරන තුරු එම සිද්ධිය තව දුරටත් අයකර ගත යුතු සිද්ධියක් ලෙස පැවතීමත්, තව දුටත් අවසන් නොවි ඇති සිද්ධින් ගණන වැඩිවිමට හේතුවේ. | වාහන අනතුරු සම්බන්ධයෙන් මූල්‍ය රීති ප්‍රකාර කටයුතු කළ යුතුය. |
| (ඈ) මහනුවර අධ්‍යාපන කලාපයේ පාසල් 35 ක අනුමත සංඛ්‍යාවට වඩා වැඩිපුර විදුහල්පති ශ්‍රේණිධාරීන් 61 දෙනෙකු සිටියදී එම කලාපයේ පාසල් 28 ක විදුහල්පති තනතුරේ වැඩබැලීමට ශ්‍රී ලංකා ගුරු සේවයේ I, II, III ශ්‍රේණියේ නිලධාරීන් පත්කර තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | විදුහල්පති පුරප්පාඩු පවතින පාසල් සඳහා ස්ථිර විදුහල්පතිවරු පත්කළ යුතුය. |

### 1.5.8 ශීර්ෂය 556 - මධ්‍යම පළාත් සංචාරක කටයුතු දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව උපරිම කාලසීමාව වන අවුරුදු 05 ක් එකම සේවා ස්ථානයේ සේවය කර ඇති සෑම නිලධාරියෙකුටම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩදීම සඳහා වහාම ස්ථානමාරු ලබාදිය යුතු බව දක්වා තිබුණද ඊට අනුකූල නොවන ලෙසට මධ්‍යම පළාත් සංචාරක කටයුතු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 10 දෙනෙකු වසර 06 සිට වසර 21 දක්වා එකම සේවා ස්ථානයේ සේවයේ යෙදී තිබුණි. | නිලධාරීන් 06 දෙනෙකු සඳහා ස්ථාන මාරුවීම් ලැබී නොතිබුණි. ස්ථාන මාරුවීම් නියෝග ලැබී නොතිබුණු නිලධාරිනියක්ද ස්ථාන මාරු කැඳවා නොමැති නිලධාරියෙක් ද විය. | චක්‍රලේඛය අනුව ස්ථානමාරු ලබා දීමට කටයුතු කළ යුතුය. |

## 1.5.9 ශීර්ෂය 557 - මධ්‍යම පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව 2016 ජුනි 20 දින නුවරඑළිය මල් වවන්නන්ගේ ව්‍යවසාය සමිතියට ලබාදී තිබුණු රු.1,250,000 ක ණය මුදල් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. | නුවරඑළිය මල් වවන්නන්ගේ ව්‍යවසාය සමිතිය වෙත නිකුත් කර ඇති 1,250,000 ක ණය මුදල එම සමිතිය තුළ පැවැති ද්‍රවශීලතා ගැටළුව හේතුවෙන් ණය වාරික අයකර ගැනිමක් සිදු නොකළද අයවියයුතු පොලිය අයකර ගැනිමට කටයුතු කරන ලදි. එසේ වුවද එම ණය වාරිකද අය කර ගැනිමට කටයුතු කරමින් පවති. | ණය මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මධ්‍යම පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිරාකරණය කිරීම සඳහා සමුපකාර සංවර්ධන නිලධාරින්ට භාරදී තිබුණු රු.500,000 කට වැඩි තීරක ගැටළුවලින්, වසර 5 කට වැඩි කාලයක් පමාවූ රු.6,245,658 ක තීරක ගැටළු 3 ක්, වසර 3 ක් කල් පමාවූ රු.16,487,484 ක තීරක ගැටළු 4 ක්, වසර 2 ක් කල් පමාවූ රු.592,459 ක තීරක ගැටළුවක් සහ වසරක් කල් පමාවූ රු.52,892,056 ක තීරක ගැටළු 17 ක් නිරාකරණය කර නොතිබුණි. | ප්‍රඥප්තියේ 58 වගන්තිය යටතේ පවත්වනු ලබන ආරවුල් බේරුම් කරන ක්‍රියාවලිය අර්ධ අධිකරණ කටයුත්තක් බැවින් ද විවිධ හා තැන්පත් ආරවුල් වශයෙන් යොමු වන ගොනු අධික මූල්‍ය වටිනාකමකින් යුක්ත බැවින් ද ආරවුල් විසඳීම සඳහා දීර්ඝ කාලයක් ගතවේ. තීරක ගැටලු විසඳිම සඳහා නිලධාරින්ගේ හිඟයක් පවතින අතර ප්‍රධාන රාජකාරියට ප්‍රමුඛත්වය ලබා දෙමින් තීරක විභාග කටයුතු සිදු කරයි. | තීරක ගැටළු නොපමාව නිරාකරණය කළ යුතුය. |

## 1.5.10 ශීර්ෂය 560 - මධ්‍යම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුහුණු කාර්ය මණ්ඩලයක් නොමැතිවීම, හදිසි ප්‍රතිකාර ඒකක ස්ථාපනය නොකිරීම, අවශ්‍ය අමතර උපකරණ සපයා නොතිබීම සහ හෙද කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පැවතීම යන හේතූන් නිසා ලෝක බැංකු සංවර්ධන ව්‍යාපෘතිය යටතේ 2015 සහ 2016 වර්ෂවලදී උඩුවෙල, | දැඩිසත්කාර ඒකක වලට අනුයුක්ත කිරීම සඳහා වන පුහුණු කාර්යය මණ්ඩලය බඳවා ගැනීමේ ක්‍රියාවලිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත රේඛීය අමාත්‍යාංශය මඟින් සිදුකළ යුතුය. | නොපමාව යන්ත්‍ර භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මොරගහ, දෙල්තොට, දොළොස්බාගේ රෝහල්වලට ලබාදී තිබුණු එකතු වටිනාකම රු.3,916,000 ක් පිරිවැය වූ හෘදරෝගීන්ගේ හෘද ස්පන්ධනය පරීක්ෂා කිරීම, උත්තේජනය කිරීම හා නැවත යථා තත්ත්වයට පත් කිරීම සඳහා යොදා ගනු ලබන යන්ත්‍ර (Defibrillator) 04 ක් 2020 දෙසැම්බර් වන විටත් අභාවිතව පැවතුණි. | | |
| (ආ) | 2018 වර්ෂයේ මධ්‍යම රජයේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන රු.10,814,800 ක් වැයකර නාවලපිටිය දිස්ත්‍රික් රෝහල සඳහා 2019 වර්ෂයේ දී පෞද්ගලික ආයතනයකින් මිලදී ගෙන තිබුණු ශාරීරික අභ්‍යන්තර චලන ක්ෂනිකව පරීක්ෂා කර රූප ලබා ගැනීමේ යන්ත්‍රය (Mobile C-arm X-ray) සවිකිරීමට අදාළ යටිතල පහසුකම් නොමැතිවීම හා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ බලපත්‍ර නොලැබීම නිසා රෝගීන් සඳහා උපයෝජනයට ගත නොහැකිව 2021 පෙබරවාරි 25 වන විගණන දිනටත් අභාවිතව පැවතුණි. | නාවලපිටිය දිස්ත්‍රික් රෝහලේ යටිතල පහසුකම් නොතිබීම හේතුවෙන් යන්ත්‍රය තෙල්දෙණිය රෝහල වෙත ලබා දී තිබුණි. තෙල්දෙණිය රෝහලේ මෙම යන්ත්‍රය භාවිතයට නොගෙන නාවලපිටිය දිස්ත්‍රික් රෝහලේ ශල්‍යාගාර අලුත්වැඩියා කටයුතු වලින් පසු 2020 ජූලි 31 දින නැවත නාවලපිටිය දිස්ත්‍රික් රෝහලට භාර දී ඇත. මෙම යන්ත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා පරමාණු බල ශක්ති නියාමන සභාව 2021 පෙබරවාරි 24 වන දින අවසර ලබා දී ඇත. ඒ අනුව අදාළ යන්ත්‍රය ස්ථාපිත කිරීමට අවශ්‍ය මූලික කටයුතු මේ වන විට සපුරා ඇති බවත් අමතර උපකරණ ලබා දීමෙන් පසු කඩිනමින් රෝගීන්ගේ සේවය සඳහා ලබා දෙන බවත් කාරුණිකව සඳහන් කරමි. | නොපමාව යන්ත්‍රය භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) පළාත් සෞඛ්‍ය සේවා කාර්යමණ්ඩලයේ සේවක මට්ටම් 04 ක පුරප්පාඩු 2509 ක් පැවතුණි. | අදහස් දක්වා නොතිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) පළාත් සෞඛ්‍ය සේවා කාර්යමණ්ඩලයේ සේවක මට්ටම් 03 ක, 87 ක සේවක අතිරික්තයක් පැවතුණි. | අදහස් දක්වා නොතිබුණි. | අතිරික්ත සේවකයන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

**1.5.11 ශීර්ෂය 561 - මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව**

---------------------------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මාතලේ දිස්ත්‍රික් මහ රෝහලේ ඖෂධ ගබඩාවේ රු.5,641,122 ක කල් ඉකුත් වූ ඖෂධ තොග පැවතුණි. | කල් ඉකුත් ඖෂධ සම්බන්ධයෙක් තවදුරටත් කොළඹ වෛද්‍ය සැපයීම් අංශය වෙත දැනුම්දී ඉදිරි කටයුතු කරන බවත් රු.25,000 ට වඩා අඩු වටිනාකමැති ඖෂධ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් වෙත පැවරී ඇති බලතල පරිදි අපහරණය කිරීමටත් කටයුතු කරමි. | කල් ඉකුත් වූ තොග අපහරණය කළ යුතුය. නිළධාරීන්ගේ නොසැලකිල්ලක් මත කල් ඉකුත් වූයේද යන්න පරීක්ෂා කළ යුතුය. |
| (ආ) දෙපාර්තමේන්තුවේ 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුළ සිදුව තිබූ වාහන අනතුරු 5 ක රු.571,824 ක අලාභ හානි සම්බන්ධයෙන් අදාළ වගකිවයුතු අයගෙන් හෝ එම අදාළ කාලය තුළ අයකර ගැනීම පැහැර හැරි නිලධාරීන්ගෙන් අයකර ගැනීම සඳහා මධ්‍යම පළාත් සභා ගිණුම් කාරක සභාව ලබාදුන් නියෝග 2021 අප්‍රේල් 30 දිනටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | මධ්‍යම පළාත් සභා ගිණුම් කාරක සභාව ලබාදුන් නියෝග ක්‍රියාත්මක කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ අවස්ථා 100 කට අදාළව වසර 1 සිට වසර 18 ක දක්වා කාල පරාසය තුළ රු.31,283,271 ක වාහන අනතුරුවලින් සිදු වී තිබුණු අලාභ හානි සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රීති 55.2.1 සහ 55.4 ප්‍රකාර මුදල් අයකර ගැනීම හෝ විනයානුකූලව කටයුතු කිරීම හෝ සිදු කර නොතිබුණි. | දීර්ඝ කාලය සිට නොවිසඳී පවත්වා වාහන ගැටළු නිරාකරණයට අදාළව මහනුවර, මාතලේ, නුවරඑළිය දිස්ත්‍රික්කවල අදාළ නිලධාරින් කැඳවා 2021 මාර්තු 19 දින අදාළ නිලධාරින් දැනුවත් කරන ලදි. | වාහන අනතුරු වලින් සිදුවන හානි හා පාඩු අයකර ගැනීම සඳහා විනය කටයුතු කඩිනම් කළ යුතුය. |
| (ඈ) 2019 මැයි 9 දින මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් විසින් අදාළ වගකිව යුතු නිලධාරීන් 14 දෙනෙකුගෙන් අයකර ගැනීමට නිර්දේශ කර තිබුණු, මහනුවර දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මඟින් සෞඛ්‍ය උපකරණ තීන්ත ආලේප කිරීම යනුවෙන් සාවද්‍ය ලෙස ගෙවා තිබුණු රු.3,114,905 ක මුදල 2021 අප්‍රේල් 30 දිනටත් අයකර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | නිර්දේශය අනුව මුදල් අයකරගත යුතුය. |

**1.5.12 ශීර්ෂය 570 - මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අමාත්‍යාංශය**

**(අ) මධ්‍යම පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරිය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාස 11 සිට අවුරුදු 08 මාස 09 දක්වා කාල පරාසයක් අයවීම හිඟහිට තිබුණු, කඩකාමර 174 කට අදාළ රු.6,884,131 ක බදු කුලී අයකර ගෙන නොතිබුණි. | ආදායම් නිසි වෙලාවට නොගෙවීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවට සියලුම කඩකාමර බදු කරුවන් වෙත ලිඛිතව දැනුම් දී ඇත.හිඟ ආදායම් කලට වේලාවට අයකර ගැනීම සඳහා නිලධාරියෙකු පත්කර ඇත. | ගිවිසුම් ප්‍රකාරව හිඟ කුලී අයකර ගත යුතුය. |

**(ආ) මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය**

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2021 පෙබරවාරි 19 විගණන දින වන විට මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රඥප්තිය අනුමත කර වසර 13 ක් පමණ ගත වී තිබුණ ද කළමනාකරණය විසින් අධිකාරියේ රැස්වීම් සඳහා ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූල වන පරිදි රීති සකස් කර නොතිබුණු අතර පරිපාලන හා විනය කාර්යය පරිපාටි අනුමත කරගෙන නොතිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි කටයුතු කිරීමට එකඟ වෙමි. | ප්‍රඥප්තියේ විධිවිධාන අනුකූල වන පරිදි රීති සකස් කළ යුතුය. |
| (ආ) | පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ කොන්ත්‍රාත් ඒකකය මඟින් ක්‍රියාත්මක කළ "ඩෝල මාර්ගය අක්කරමලේ තුන්වන පටුමග හා ග්‍රීන්වුඩ් පාසැල්මාවත" ඉදිකිරීමේ දී ඇස්තමේන්තුවේ සඳහන් මිලට ටෙන්ඩරය පිරිනමා තිබුණි. ඒ අනුව කර්මාන්තය සඳහා කිලෝ මීටර් 35 ක් දුරින් ප්‍රවාහනය කළ ගල්තාර (Asphalt) මෙට්‍රික් ටොන් 929 ට ඇස්තමේන්තුවේ සඳහන් ප්‍රවාහනය කළ දුර ප්‍රමාණය වන කිලෝ මීටර් 70 සඳහාම ගෙවීම් කිරීම හේතුවෙන් වැඩිපුර කිලෝ මීටර් 35 ක් සඳහා කිලෝ මීටරයකට රු.44.64 බැගින් ප්‍රවාහනය කළ ගල්තාර (Asphalt) මෙට්‍රික් ටොන් 929 ක් වෙනුවෙන් රු.1,451,470 ක මුදලක් පෞද්ගලික උප කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි. | 2018 දී ඇස්තමේන්තු පිළියෙල කරන අවස්ථාවේදි ඉහත සඳහන් ස්ථානයේ Asphalt නිෂ්පාදන කටයුතු නවතා තිබූ නිසා එම ස්ථානයේ මිල ගණන් ඇතුළත් නොකළ බවත් දන්වමි. තවද කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම් සිදු කරනු ලබන්නේ කොන්ත්‍රාත්කරු ලංසු ඉදිරිපත් කරන අයිතම සඳහා බවත් මෙහිදී ද Asphalt wearing සහ Asphalt Binder සඳහාද ගෙවීම් සිදුකර ඇත්තේ නිෂ්පාදනය ද්‍රව්‍ය පැටවීම සහ ප්‍රවාහන ගාස්තු සියල්ල ඇතුළත් එක් අයිතමයක් ලෙස බවත් වෙන වෙන් වශයෙන් නොවන බව දන්වමි. | පරීක්ෂණයන් සිදුකර වගකිවයුත්තන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුය. වැඩිපුර ගෙවූ මුදල් ආපසු අයකරගත යුතුය. |

**1.5.13 ශීර්ෂය 571 - මධ්‍යම පළාත් නිවාස දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට, 1997 වසරේ සිට මධ්‍යම පළාත් නිවාස දෙපාර්තමේන්තුව විසින් සෘජුවමද, 1994 වසරේ සිට 1996 වසර දක්වා සහ 1999 වසර තුළ සීමා සහිත සණස සමිති මඟින් ද 1994 සිට 1999 දක්වා සමුපකාර සමිති මඟින් ද මධ්‍යම පළාත් නිවාස දෙපාර්තමේන්තුව නිවාස නොමැති පවුල් වෙත ලබා දී ඇති නිවාස ණය වලින් පිළිවෙලින් අයවීමට ඇති මුදල හා පොලිය රු.3,588,424 ක්, රු.1,082,548 ක් සහ රු.2,165,790 ක් අයකරගෙන නොතිබුණි. | පුද්ගලයින් වෙත සෘජු ණය ලබා දීම - 435 දෙනෙකුගෙන් ණය රු.1,993,192 ක් හා පොලිය රු.484,804 අයවිය යුතුව ඇත.<br>සමුපකාර සමිති හරහා ණය ලබා දීම - ප්‍රතිලාභීන් 268 දෙනෙකුගෙන් ණය රු.1,629,832 ක් හා පොලිය රු.289,386 ක මුදලක් අයවීමට ඇත.<br>සණස ණය දෙන සමිතිය මඟින් ණය ලබා දීම - ප්‍රතිලාභීන් 177 දෙනෙකුගෙන් ණය රු.1,024,111 ක් හා පොලිය රු.261,253 ක මුදලක් අයවීමට ඇත.<br>ඉහත ණය අයකර ගැනීම සඳහා විවිධ පියවරයන් ගෙන ඇත. | හිඟ ණය මුදල් හා පොලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.14 ශීර්ෂය 580 - මධ්‍යම පළාත් කර්මාන්ත අමාත්‍යාංශය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් යෞවන කටයුතු, වනිතා කටයුතු, ග්‍රාමීය සංවර්ධන, සමුපකාර සංවර්ධන හා කර්මාන්ත අමාත්‍යාංශය 2016 වසරේ සිට 2019 දක්වා රු.45,581,286 ක මහන මැෂින් 1760 ක් මිලදී ගෙන ස්වයං රැකියා ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් මධ්‍යම පළාතේ කාන්තාවන් අතර බෙදාහැර තිබුණි. බෙදාදුන් එම මහන මැෂින් පිළිබඳ පසු විපරම් කටයුතු 2019 වර්ෂය වන තෙක් සිදු කර නොතිබුණු අතර අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේ පසු විපරම් කටයුතු කරන ලද ප්‍රතිලාභීන් 864 කින් 302 ක්ම ස්වයං රැකියාවක් ලෙස ඇඳුම් මැසීමේ නොයෙදෙන බැවින් ව්‍යාපෘතියේ අරමුණ ඉටු වී නොතිබුණි. | විමධ්‍යගත මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ප්‍රතිපාදන ලැබී ඇත. ව්‍යාපෘති යෝජනාව අමාත්‍යාංශයේ ක්‍රියාත්මක සැලැස්මට ඇතුළත් නොවේ. ඒවා ක්‍රියාත්මක කිරීමට පමණක් කර්මාන්ත අමාත්‍යාංශයට ලැබී ඇත. යෝජනා අනුමත ප්‍රතිලාභී නාම ලේඛණය ගරු මන්ත්‍රීතුමා විසින් අමුණා එවා තිබුණි. අමාත්‍යාංශය විසින් සැළකියයුතු ප්‍රධාන අවශ්‍යතා සපුරාලීමට උපරිම කටයුතු සිදුකරන ලදී. | ස්වයං රැකියා ව්‍යාපෘති සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය. |

## 1.5.15 ශීර්ෂය 581 - මධ්‍යම පළාත් පේෂකර්ම දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පළාත් මුල්‍ය රීති 378.2 කිසියම් නිශ්චිත කටයුත්තක ලාභ ඇතුළත් කිරීමට වාර්ෂික ආදායම් ඇස්තමේන්තුවල නිශ්චිත ආදායම් ශීර්ෂයක් නොමැති අවස්ථාවල උපයන ලාභය පළාත් සභා විවිධ ආදායම් ශීර්ෂයට බැර කළ යුතු වුවත් එසේ නොකර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.16,712,066 ක මුදලක් පේෂකර්ම වැඩපළ පිහිටුවීම හා පරිපාලනය පිළිබඳ වාණිජ අත්තිකාරම් ගිණුමට අදාළ ජංගම බැංකු ගිණුමේ රඳවා තිබුණි. | වාණිජ අත්තිකාරම් ගිණුමට අදාළව වාර්ෂික මෙහෙයුම් කටයුතු සඳහා පළාත් භාණ්ඩාගාරයෙන් කිසිදු අග්‍රිමයක් ලබා නොදෙන අතර පේෂකර්ම නිෂ්පාදන අලෙවිය තුළින් ලැබෙන ආදායම භාවිතා කරමින්, කර්මාන්තයේ සේවිකාවන් ගේ වැටුප් ඇතුළු පෙහෙකම් නිෂ්පාදනයට අදාළ වියදම් සිදුකරනු ලබයි. ඒබැවින් උපයන ලාභයෙන් කොටසක් මධ්‍යම පළාත් සභා අරමුදල වෙත ප්‍රේෂණය කරනු ලබයි. | නිශ්චිත ආදායම් ශීර්ෂයක් නොමැතිව උපයන ලාභය පළාත් සභා විවිධ ආදායම් ශීර්ෂයට බැරකළ යුතුය. |

## 1.5.16 ශීර්ෂය 584 - මධ්‍යම පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2019 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මධ්‍ය පළාතේ රජයේ කාන්තා සංවර්ධන මධ්‍යස්ථාන වලට ලබා දී තිබුණු මහන මැෂින් 31 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනටත් අභාවිතව පැවතුණි. | මෙම මැෂින් ඉතා පැරණි තත්ත්වයේ මැෂින් වන අතර අලුත්වැඩියා කර භාවිතා කිරීමද අපහසුය. එබැවින් මාගේ CPC/RD01/2021/ භා.ස.01 අංක දරණ 2021.02.17 දිනැති කර්මාන්ත අමාත්‍යාංශය ලේකම් වෙත මධ්‍යස්ථාන වල අක්‍රිය තත්ත්වයේ පවතින මහන මැෂින් සම්බන්ධව තාක්ෂණික වාර්තාවක් ලබා ගැනිමට කමිටුවක් පත් කරන මෙන් ඉල්ලීම් කර ඇති අතර අදාළ කමිටු නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදුකරන බව කාරුණිකව දන්වා සිටිමි. | අභාවිතව පවතින මැෂින් අලුත්වැඩියා කර භාවිතා කිරීමට හෝ අපහරණය කළ යුතුය. |

**1.5.17 ශීර්ෂය 590 - මධ්‍යම පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගෙ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මධ්‍යම පළාත තුළ වතු ආශ්‍රිත මිරිදිය මත්ස්‍ය වගාව දියුණුකිරීමේ අරමුණින් 2017 වර්ෂයේදී ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ රු.4,479,184 ක් ප්‍රතිපාදන මත පොකුණු 13 ක් ඉදිකර තිබුණි. විගණන දින වූ 2020 සැප්තැම්බර් 25 දින වනවිට ස්ථානගත කිරීමේ දෝෂ සහ එම පොකුණුවලට මත්ස්‍ය ඇඟිල්ලන් මුදා නොහැරීම හේතුවෙන් අදාළ ව්‍යාපෘතිය මුළුමනින්ම අසාර්ථක වී තිබුණි. රජයෙන් දරන ලද වැය මුළුමනින්ම නිෂ්කාර්ය වී තිබූ අතර ඉදිකිරීම් සිදුකිරීමට පූර්වයෙන් ඉඩමේ නෛතික අයිතිය රජයට පවරා ගැනීමට ද කටයුතු කර නොතිබුණි. | පැවැති වාර්තා අනුව මෙම පොකුණු 13 මත්ස්‍ය ඇඟිල්ලන් තැන්පත් කිරීමට සැලැසුම් කර ඇති බවත් ප්‍රතිලාභීන් සාර්ථකව පවත්වා ගැනීමට දායක විය යුතු බව දන්වා ඇති බවත් දන්වමි. | ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |

**1.5.18 ශීර්ෂය 591 - මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගෙ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද පළතුරු ගම්මාන වැඩසටහනෙහි ප්‍රගතිය පරීක්ෂාවේදී කෘෂි උපදේශ කොට්ඨාශ 16 ක් වෙත ලබාදුන් රු.3,726,100 වටිනා පළතුරු පැළ 26625 කින් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට සාර්ථකව පවත්වාගෙන ගොස් තිබුණු පැළ සංඛ්‍යාව 13970 ක් වූ අතර එම කාල පරිච්ඡේදය තුළදී ලබාදුන් පැළවලින් එකතු වටිනාකම රු.1,756,100 ක් වූ පැළ 12655 ක් එනම් සියයට 48 ක ප්‍රතිශතයක් හානි වී තිබුණි. | සුළු හා මධ්‍ය පරිමාණ පලතුරු වගා ව්‍යප්තිය වැඩි කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන පළතුරු ගම්මාන වැඩසටහන පලතුරු වගා වපසරිය ඉහල නැංවීම, පළතුරු නිෂ්පාදනය වැඩි කිරීම, හා පළතුරු වගා ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීම යන අරමුණු පාදකව ක්‍රියාත්මක කරන අතර මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ලෙස ගොවීන් සඳහා පැළ ලබා දීමේදී ඉතා වගකීමෙන් යුතුව එය සිදු කරනු ලබයි. නමුත් විවිධ හේතුන් මත පැළ විනාශ විය හැකි බව දන්වමි. | මෙය අසාමාන්‍ය හානියක් බැවින් පරීක්ෂණයක් සිදුකළ යුතුය. |